**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහන - 2 අදියර - 2021**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහනේ - 2 අදියරේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කොළඹ මහ නගර සභාව සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජුනි 03 දින එළඹි අංක 3030 දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.10 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

---

ණය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා වැඩිදියුණු කිරීම හා කළමනාකරණය කිරීම සහ මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය හා අපජල සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම ප්‍රකාරව වැඩ සටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,230.60කට සමාන එජඩො මිලියන 9.44ක් වන අතර ඉන් රු.මිලියන 1,042.88කට සමාන එජඩො මිලියන 08ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 187.22කට සමාන එජඩො මිලියන 1.44ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. වැඩසටහන එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 23 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් තිබුණි. කෙසේවෙතත්, වැඩසටහනේ කටයුතු අවසන් කිරීමේ දිනය 2022 ඔක්තෝබර් 24 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

------

වැඩසටහනේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 නීති,රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම**

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | සමාලෝචන කමිටු මාස 02 කට වරක් පැවැත්විය යුතුවේ. කෙසේවෙතත්, 2021 වර්ෂය තුළදී සමාලෝචන කමිටු රැස්වීම් හතරක් පමණක් පවත්වා තිබුණි. | කොවිඩ්-19 හේතුවෙන් සෞඛ්‍ය අංශ මගින් ක්‍රියාත්මක කරන ලද රෙගුලාසිවලට අනුගතවෙමින් රැස්වීමක් සංවිධානය කිරීම අසීරුවිය. | විකල්පයක් ලෙස මාර්ගගත රැස්වීම් පැවැත්වීම කළ යුතුව තිබුණි. |

**3. භෞතික කාර්යසධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට | | විගණන ගැටලුව | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | අත්කරගත් කාර්යසාධනය ප්‍රතිශතය | | |
| සැලසුම්කරණ අධීක්ෂණය ආයතනික සංවර්ධන උපදේශනය | 100 | 58 | වැඩසටහන 2014 ජුනි 03 දින ආරම්භ කර 2019 ජුනි 30 දින නිම කිරීමට සැලසුම්කර තිබුණද, නිම කිරීමේ දිනය 2022 ඔක්තෝබර් 24 දක්වා දෙවතාවක් දීර්ඝ කර තිබුණි. | කොන්ත්‍රාත් පරිපාලනයේ, ව්‍යාපෘති ප්‍රතිපාදන, ශක්‍යතා අධ්‍යන, පාරිසරික ඇගයීම්, ඉඩම් අත්පත් කර ගැනීම්, නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ පැවති දුර්වලතා හේතුවෙන් මෙම වැඩසටහන මන්දගාමීව සිදුවන වැඩසටහනක් ලෙස වාර්තා කර තිබුණි. |
| (අ) මාදම්පිටිය අපජල පවිත්‍රාගාරය | 100 | නොමැත | 2021 දෙසැම්බර් 31 වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා වන ඉඩම අත්පත් කරගෙන නොතිබුණු අතර පාරිසරික බලපෑම් | 2019 සැප්තැම්බර් 28 දින උපදේශන ආයතනය විසින් පිළියෙල කරන ලද ලංසු ලියවිලි සමාලෝචනය සඳහා |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ඇගයීමේ වාර්තාව පිළියෙල කිරීමේ කටයුතු තාවකාලිකව නවතා තිබුණි. | ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කර තිබුණි. නමුත් සංරචකය අඛණ්ඩව කරගෙන යාමට අරමුදල් හිගවීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 වන විටත් ලංසු ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. |
| (අ) | උතුර ජල පෝෂක ප්‍රදේශයේ මලාපවහන 7ක් සඳහා පහසුකම් සැපයීම | 100 | නොමැත | භූ තාක්ෂණික විමර්ශණ සඳහා වන කොන්ත්‍රාත්තුවේ ලංසු කැඳවීම නිමකර නොතිබුණි. | අමතර ණය මුදල් නොමැති වීම. |
| (ඇ) | උතුර ජල පෝෂක ප්‍රදේශයේ පවතින කුඩා පොම්පාගාර 5ක් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම | 100 | නොමැත | 2021 දෙසැම්බර් 31 දිනට තත්ත්වය පිළිබද තක්සේරුව ආරම්භ කර නොතිබුණි. | සංවර්ධන කටයුතු සඳහා අරමුදල් නොමැති වීම. |
| (ඈ) | මාලිගාවත්තේ සිට මාදම්පිටිය පොම්පාගාරය දක්වා මූලික බඳක් සහිත මලාපවහන ඉදිකිරීම | 100 | නොමැත | කෙටුම්පත් ලංසු නිමකර ඇත. නමුත් කටයුතු ප්‍රදානය කර නොමැත. | අරමුදල් සීමාවීම හේතුවෙන්. |
| (ඉ) | උතුරු ජල පෝෂක ප්‍රදේශයේ මලාපවහන වැඩිදියුණු | 100 | නොමැත | කෙටුම්පත් ලංසු ලියවිලි 2019 සැප්තැම්බර් 28 දින සමාලෝචනය සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කර ඇත. නමුත් අනුමත කර | අරමුදල් සීමාවීම හේතුවෙන් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කිරීම, පුනරුත්ථාපන කිරීම සහ අලුත්වැඩියාව | | | නොමැත. | |
| (ඊ) | සීසීටීවී සහ විශේෂ උපකරණ භාවිතයෙන් පවතින මලාපවහන පද්ධතියේ කිලෝමීටර් 97.2ක තත්ත්වය තක්සේරු කිරීම | 100 | 1 | 2016 වර්ෂයේදී ලංසු ක්‍රියාවලිය ආරම්භ කර තිබුණද කොන්ත්‍රාත්තුව 2021 ඔක්තෝබර් 12 දින ප්‍රදානය කර තිබුණි. | නියම කර ඇති කාලරාමුව තුළ වැඩසටහනේ ප්‍රධාන කටයුතු ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් වැඩසටනේ අපේක්ෂිත අරමුණු ලගාකර ගත නොහැකි වේ. |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** ප්‍රමාදය සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන් නොමැතිවීම, පවතින කොන්ත්‍රාත්වල මන්දගාමී ප්‍රගතිය, ලංසු ලියවිලි සකස් කිරීමේ ප්‍රමාදයන්, ප්‍රමුඛතා කොන්ත්‍රාත් අවසන් කිරීමේ ප්‍රමාදයන් හේතුවිය.

**විගණකගේ නිර්දේශ** වැඩසටනේ කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර වැඩසටහනේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීමට අවශ්‍ය වේ.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| සීසීටීවී භාවිතයෙන් අපජලය පිරිසිදු කිරීමේ සමීක්ෂණය සිදු කිරීමේ සහ මලාපවහන නාලිකාවල කිලෝමීටර් 108ක දත්ත සමුදායක් පිළියෙල කිරීමේ ප්‍රසම්පාදන කටයුතු 2016 ජුලි 01 දින ආරම්භ කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, 2021 ඔක්තෝබර් 12 ප්‍රදානය කර තිබුණි. | ප්‍රසම්පාදන ආයතනයට දේශීය අරමුදලින් මූල්‍යනය කරන ව්‍යාපෘතිවලට වඩා විදේශ අරමුදලින් මූල්‍යනය කරන ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වැඩි පියවර ප්‍රමාණයක් අනුගමනය කිරීමට සිදුවීම නිසා එය කොන්ත්‍රාත්තුවක් තෝරාගැනීම සහ ප්‍රදානය කිරීම සඳහා වැඩි කාලයක් ගෙන තිබුණි. | කාලය අපතේයාම අවමකර ගැනීමට සහ වැඩසටහනේ කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර වැඩසටහනේ කටයුතු නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |